# වේදිකාව අපේ නිවහනයි

## කුසුම්සිරි - යශෝධරා

### මුහුණට මුහුණ

**ශ්‍රීනාත් මද්දුමගේ**





ගිය වසරේ එක් දවසක මාලිනී ජයසිංහ මහත්මිය මට අපූරු කතාවක් කිව්වා. මනමේ කුමාරි ඔස්ට්‍රේලියාවේ පදිංචියට එන බව. මම එදා හිතුවා ඇය ගැන පත්තරේ සටහනක් තබන්න. නමුත් ඒකට ඉඩක් සැළසුණේ නැහැ. නමුත් මනමේ කුමාරිත් ඇගේ ස්වාමියාත් එකට එක්ව මෙල්බන් නුවර පදිංචි දූ දරුවන් සමඟ අලුත් වැඩක් කිරීමට සැරසෙන මේ වෙලාව එම සාකච්ඡාවට සුදුසුම කාලයයි කියලා මට හිතෙනවා.

2000 වසරේ කැළණි විශ්ව විද්‍යාලයේ නාට්‍ය උත්සවය සංවිධානය කිරීමේ දී මූලිකත්වය ගෙන වැඩ කළ කථිකාචාර්යවරියක හිටියා. ඇය එම වසරේම නවසීලන්තයේ වැඩි දුර අධ්‍යාපනයට ආවා. ඇගේ ද සංවිධානයෙන් කැළණිය විශ්ව විද්‍යාලයේ පැවැත්වූ නාට්‍ය උත්සවයේ එක් නාට්‍යයක රඟපෑමේ භාග්‍යය මට ද හිමිවුණා. ඒ වරෙන්තු නාට්‍ය ය.

**ශ්‍රීනාත්**
2001 වසරේ ඔබ නවසීලන්තයට ආවේ ඇයි?
**යශෝධරා**
මම Cultural Sociology පිළිබඳ ආචාර්ය උපාධියක් සඳහා නවසීලන්තයේ මැසී විශ්ව විද්‍යාලයට සම්බන්ධ වුණා. ඊට පස්සේ ඔස්ට්‍රේලියාවට ආවා.

**ශ්‍රීනාත්**
මුලින්ම මනමේ කුමාරි හැටියට රඟපෑවේ මොන වසරේ ද?
**යශෝධරා**
පළමුවෙන්ම රඟපාන්න අවස්ථාව ලැබුණේ එංගලන්තයේ ලන්ඩන් නුවර දී වේදිකා ගත වුණ අවස්ථාවේ. ඒ 1988 දී. එතනින් පස්සෙ නවසීලන්තයට එනතෙක් මම මනමේ කුමාරි හැටියට රඟපෑවා.

**ශ්‍රීනාත්**
මනෙමේ නාටකයේ විතරද රඟපෑවේ?
**යශෝධරා**
නෑ... මගේ තාත්තා (මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර) කළ හැම නාට්‍යයකම මම රඟපෑවා..

**ශ්‍රීනාත්**
නවසීලන්තයේ දීත් නාට්‍ය කලාව වෙනුවෙන් යමක් කරන්න ඉඩක් ලැබුණ ද?
**යශෝධරා**
ඔව් ශ්‍රීනාත්.. අපි එහිදී නවසීලන්තයේ වෙසෙන දූ දරුවන් වෙනුවෙන් නාට්‍ය වැඩ මුළුවක් සංවිධානය කළා. එය ඉතා සාර්ථක වුණා. 2002 ඉඳන් ඔස්ට්‍රේලියාවට එන තෙක් අපි ඒ වැඩ මුලුව දිගටම කරගෙන ගියා. එහිදී වැඩ මුලුව ආශ්‍රයෙන් නාට්‍ය 8 ක් විතර කෙරුවා. එහිද අපි වැඩිපුර ම කළේ අපේ ගැමි නාට්‍යය පිළිබඳ ඉගැන්වීමයි.
**ශ්‍රීනාත්**
ගැමි නාට්‍ය කලාව විතරද ඉගැන්නුවේ?
**යශෝධරා**
නෑ.. රංගනය. සංගීතය.. සහ අනෙකුත් සියලුම කාරණා අපි ළමයින්ට ඉගැන්නුවා.

**ශ්‍රීනාත්**
ඔබ දෙපළ නාට්‍ය කලාව සම්බන්ධයෙන් ඉතා ඉහළ දැනීමක් ඇති දෙදෙනෙක්. ඒ දැනුම මෙහේ ළමයින්ට නාට්‍ය කලාව උගන්වන්න යොදවන්න අදහස් කළේ නැද්ද?
**යශෝධරා**
අපි මේ වෙනකොට අපි දන්නා ශිල්පය මෙහේ ඉන්න අපේ දරුවන්ට උගන්වන්න වැඩ සටහනක් ක්‍රියාත්මක කරගෙන යනවා.

**ශ්‍රීනාත්**
නවසීලන්තයේ ළමයි හා ඔස්ට්‍රේලියාවේ ළමයි අතර ඔබ දකින වෙනසක් තිබෙනවා ද?
**යශෝධරා**
පැහැදිළි වෙනසක් තියෙනවා.. ඒ තමයි මෙහේ ඉන්න බොහෝ ළමයින්ට හොඳට සිංහල කතා කිරීමට හැකි වීම. ඒ එක්කම නාට්‍ය ගැන හොඳ අවබෝධයක් තිබීම. ඒකට මූලික හේතුව ලෙස අපි දකින්නෙ මෙහි ජීවත්වන දෙමාපියන් කලාව හා සාහිත්‍යට දක්වන ලැදි කම. ඒ වගේම ළමයින්ට කලා ශිල්ප උගන්වන්න දැඩි උවමනාවක් තිබීම. එය අපට සතුටක්.

**ශ්‍රීනාත්**
දැන් මේ වෙනකොට ඔබේ වැඩ මුලුවේ ඉදිරි සැළසුම කොහොම ද?
**යශෝධරා**
අපේ වැඩමුලුවට සහභාගිවන ළමුන් සියලුදෙනාම එකතු කරගෙන දඟයා සහ මුත්තා නමින් වේදිකා නාට්‍යයක් අපි නිර්මාණය කරළා තියෙනවා. මෙම නාට්‍යය **2008 මාර්තු 08** වේදිකා ගත වෙනවා. මෙම නාට්‍යයට සංගීතයෙන් රොහාන් නෙත්තසිංහත් ප්‍රවීණ නාට්‍ය ශිල්පීන් දෙදෙනෙකු වන රුක්මාල් නිරෝෂණත් භානුක මනෝරත්නත් තවත් තවත් ශිල්පීන් ශිල්පිණියන් කීප දෙනෙකුත් එකතු වෙනවා. එදාට ඔබට ඉතා උසස් නාට්‍ය සන්දර්ශණයක් දැකගන්න අවස්ථාව උදාවන බව අපට සහතිකයි.

**ශ්‍රීනාත්**
ඒ කියන්නෙ මේ නාට්‍යයෙන් පසුව ඔබේ වැඩ මුලුව අවසාන වෙනවා ද?
**යශෝධරා**
නෑ.. මේ තමයි අපේ වැඩ මුලුවේ ආරම්භය. තව ඉදිරියට අපි යම් දෙයක් දන්නවා නම් ඒ සියලු දේ ම කියා දී හොඳ රංග ශිල්පීන් බිහි කිරීම අපේ බලාපොරොත්තුවයි.

**ශ්‍රීනාත්**
කුසුම්සිරි.. මට මතක හැටිය ඔබට ළමා නාට්‍ය පිළිබඳව ලොකු අත්දැකීමක් තියෙනවා.. 1996 ඔබ රාජ්‍ය නාට්‍ය උළෙලේ දී සම්මානයට පාත්‍රවුණා නේද?
**කුසුම්සිරි**
ඔව්.. මං 1996 දී කළ ''ඔක්කොමල්ලා කොල්ලකාලා'' ළමා නාට්‍යය සම්මානයට පාත්‍ර වුණා. ඊට අමතරව 1996 හා 1999 රාජ්‍ය කෙටිනාට්‍ය උළෙලේ දී මගේ නාට්‍ය සම්මානයට පාත්‍ර වුණා.

**ශ්‍රීනාත්**
ඔබ දෙපළ නිෂ්පාදනය කළ මේ නාට්‍යය ගැන යමක් කියන්න පුලුවන් ද?
**කුසුම්සිරි**
අපි මෙවර නාට්‍ය දෙකක් ඉදිරිපත් කරනවා. ඒ දෙකටම ගැමි නාට්‍ය සම්ප්‍රදාය යොදාගෙන තිබෙනවා. විශේෂයෙන්ම නැටුම් සංගීතය. මේක ළමුන් සමග එක්ව කළ නාට්‍යයක් වුනත් මේක ළමයින්ට පමණක් රස විඳිය හැකි නාට්‍යයක් නෙවෙයි. සියලු දෙනාටම රස විඳිය හැකි නාට්‍යයක්. අපේ නාට්‍ය වැඩ මුලුවේ එක් අංගයක්.

**ශ්‍රීනාත්**
ඔබ මහාචාර්ය සරච්චන්ද්‍ර මහත්තයගෙ නාට්‍ය වලට සම්බන්ධ වුණේ මොන කාලෙද?
**කුසුම්සිරි**
මම මුලින්ම සම්බන්ධ වුනේ 1995 දී පමණ. සිංහබාහු නාට්‍යයට. ඊට පස්සෙ මනමේ මහාසාර රත්තරන් එළොව ගිහින් මෙළොව ආවා වැනි නාට්‍ය වල රඟ පෑවා. 95 සිට නවසීලන්තය පැමිණෙන තෙක් මම මනමේ කුමාරයාගේ භූමිකාව රඟපෑවා.

**ශ්‍රීනාත්**
ඔබ නවසීලන්තයේදී නාට්‍ය කලාව පිළිබඳව වැඩිදුර හැදෑරුවේ නැද්ද?
**කුසුම්සිරි**
මම වීඩියෝ කාත්ෂණය හා ග්‍රැෆික්ස් කලාව පිළිබඳව හැදෑරුවා.

**ශ්‍රීනාත්**
ළමා නාට්‍ය පඹණක්ද කරන්න හිතා ඉන්නෙ..?
**කුසුම්සිරි**
නෑ.. අපේ බලාපොරොත්තුවක් තිබෙනවා ළමයින් සහ වැඩැහිටියන් සම්බන්ධ කරගෙන තවත් මෙවැනිම අපූරු නිර්මානයක් කරන්න.

**ශ්‍රීනාත්**
ඔබ දෙපළ කරගෙන යන මෙම නාට්‍ය වැඩමුළුව ගැන ඔබ සතුටු වෙනවද?
**කුසුම්සිරි**
අනිවාර්යයෙන්ම. අපි මෙහිදී දැකපු දේ තමයි අපේ දරුවන්ට නොයෙක් නොයෙක් මාධ්‍යයන් තිබුණත් නාට්‍ය කලාව හා රංගන වින්‍යාසය පිළිබඳව මුල සිට ක්‍රමවත්ව හැදෑරීමක් කරන්න අවකාශයක් නැති බව. එනිසා අපි දෙපළ ගේ අත්දැකීමුත් අපි ඉගෙනගත් දේත් මෙහි වෙසෙන වැඩැහිටි හා ළමයින් සමග බෙදා හදා ගන්නට අප දරන උත්සාහය අතිශය සාර්ථක බව අපට දැනටම වැටහිලා තිබෙනවා.

**ශ්‍රීනාත්**
එසේ නම් එළඹෙන **මාර්තු 08** දින දී දඟයා සහ මුත්තා නාට්‍ය ශලාවේදී සියලු මෙලබන් රසිකයන් හා එක්වෙමු. ඔබ දෙපළ ගේ ඉදිරි කටයුතු සාර්ථක වේවා කියලා අපි පතනවා.

### දඟයා සහ මුත්තගෙ විත්ති



කුසුම්සිරි ලියනආරච්චි සහ යශෝධරා සරච්චන්ද්‍ර විසින් ආරම්භ කරන ලද ළමා නාට්‍ය වැඩමුළුවේ ප්‍රථම නිෂ්පාදනය **2008 මාර්තු 08 වන සෙනසුරාදා වේදිකාගත වෙයි. සවස 2 ට සහ 6 ට** වශයෙන් දර්ශන වාර දෙකකි. මෙල්බර්න් වල නොයෙක් මාදිලියේ නාට්‍ය නිර්මාණ රඟ දැක්වෙනව. ඒවයෙන් සියයට අනූනමයක්ම පාහේ වැඩිහිටියන් සහභාගි වෙන වැඩිහිටියන් උදෙසා බිහිවෙන නිර්මාණ. දඟයා සහ මුත්තගෙ විත්ති නාට්‍යද්වයේ විශේෂත්වය තමයි ළමුන් සහ වැඩිහිටියන් විසින් මූලිකවම ළමුන් උදෙසා කෙරෙන නාට්‍ය දෙකක් වීම. මූලිකවම ළමුන් උදෙසා උනත් වැඩිහිටියන්ටත් එකසේ රස විඳින්න පුළුවන් නාට්‍ය දෙකක්. සිංහල ජන රංග ශෛලීන්, සංගීතය, නර්ථනය මිශ්‍රිතව නිර්මාණය කෙරෙන දඟයා සහ මුත්තගෙ විත්ති මෙල්බර්න් සිටින අපේ ළමුනට නව්‍ය වූ නාට්‍ය අත්දැකීමක් වෙනු නොඅනුමානයි.

දඟයා සහ මුත්තගෙ විත්ති රංගනයෙන් පෝෂණය කරවන අපේ ළමාකැළ මෙසේයි... හසිනි ඉලංගරත්න, වසුන්දරා ඕපනායක, තිලිනි රණසිංහ, මංජිත විජේසිංහ, හසිනි වල්පොල, දිලීෂා වල්පොල, නෙවින් වල්පොල, නෙත්මා මල්ලව, ලක්ෂාන් වල්පොල, ජනනි සේනාරත්න, නිර්මාණි සේනාරත්න, මධුර බණ්ඩාර, සම්මානි සේනාරත්න, මනීෂා ගමගේ, හසිත බණ්ඩාර, කසුනි පාදුක්කගේ, සිදත් බණ්නැහැක, දෙවිමි බණ්නැහැක, තිෂාරා කත්රිආරච්චිගේ, සෂික දොඩවත්ත, විනුකි මල්ලව, දිලිනි ජයසිංහ, සමිත් ජයසිංහ. ළමුනට දහිරිය දෙමින් ඊට රංගනයෙන් දායකවන වැඩිහිටි කැළ අජිත් ද සිල්වා, දිලිනි වල්පොල, වසන්ත මුතුමාල, ලක්ෂ්මන් ගමගේ.

කුසුම්සිරිගේ පිටපත් වර්ණවත් කරමින් යශෝධරා නිර්මිත සංගීත තනු වලට පණ පොවමින් සංගීතය මෙහෙයවනුයේ රොහාන් නෙත්සිංහ විසින්. සහභාගිවන වාදක මඩුල්ලෙන් වැඩිපිරිසක් රොහාන් යටතේ සංගීතය හදාරන අපේම දරු දැරියන් වීමත් මෙහි විශේෂිත කරුණක්.

මෙල්බර්න් වෙසෙන ඔබේ දරුදැරියනට සුන්දර වූ සිංහල නාට්‍ය අත්දැකීමකට දඟයා සහ මුත්තගෙ විත්ති නාට්‍ය කැලෙන් ඔබට කෙරෙන සොඳුරු ඇරයුමයි මේ...